# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1989/28 - 2016 ඔක්තෝබර් මස 19 වැනි බදාදා - 2016.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටු සඳහා කාර්ය පටිපාටිය හා ගණපූරණය සඳහා වූ රීති

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන කමිටුවල රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය හා ගණපූරණය සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(3) වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීති.

1. මෙම රීති, "රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(3) වන ව්‍යවස්ථාව යටතේ පනවනු ලබන කමිටු කාර්ය පටිපාටිය හා ගණපූරණය සඳහා වූ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සභාපති ලෙස නම් කරනු ලබන සාමාජිකයෙකු සියලු රැස්වීම්වල සභාපතිත්වය දැරිය යුතු ය.

3. කමිටු රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණෙන අවස්ථාවකදී අනෙකුත් සාමාජිකයන් දෙදෙනාගෙන් එක් අයෙකු එම රැස්වීමේ මුලසුන ගෙන කටයුතු කළ යුතු ය.

4. රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකු විය යුතු ය.

5. කිසියම් රැස්වීමකදී සාමාජිකයින් දෙදෙනෙකු විසින් ගනු ලබන යම් තීරණයක් කමිටුවේ වලංගු තීරණයක් ලෙස ස්ථාපනය විය යුතු ය.

6. කමිටුව වෙත පවරා දෙනු ලැබ ඇති කාර්යයන් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීම සඳහා වග බලා ගැනීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද විමසා අවශ්‍ය වේ යැයි සැලකෙන වාර ගණනකදී එකී කමිටුව රැස් විය යුතු වන්නේ ය.

7. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යම් කමිටු ලේකම්වරයෙකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(4) ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියා කරමින් කමිටුවක සෑම රැස්වීමක් සම්බන්ධයෙන් ම සටහන් පවත්වා ගත යුතු අතර එම රැස්වීම්වල සත්‍ය කාර්ය වාර්තා සටහන් එහි අඩංගු විය යුතු ය.

8. එසේ පවත්වා ගනු ලැබූ කාර්ය සටහන්, ඒවා ස්ථිර කරනු ලැබීමෙන් අනතුරුව, එකී යම් කමිටු රැස්වීමක කාර්ය වාර්තා සටහන්වල සත්‍ය වාර්තාවක් ලෙස පිළි ගත යුතු වන්නේ ය.

9. 2009 පෙබරවාරි මස 20 වන දිනැතිව අංක 1589/30 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ කාර්ය පටිපාටික රීතිවල 234 වන රීතියෙහි සඳහන් විධිවිධාන, කමිටුවක තීරණයක් මගින් අගතියට පත් යම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කරනු ලබන යම් අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.


1A - G 24401 — 57 (2016/10)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

10. මෙම රීති මගින් ද විධිවිධාන සලසා නොමැති කාර්ය පටිපාටියකට අදාළ යම් කරුණක් වෙතොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් නිගමනය කළ යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 ඔක්තෝබර් මස 18 වන දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

11 - 133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.